# කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදකයින් දිරි ගැන්විම







රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

## 01. ව්‍යාපෘතියේ නම

**කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදකයින් දිරි ගැන්වීම**

## 02. හැදින්වීම

මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් තඹලගල, පුංචි සෙළුවාකන්ද කන්දෙනුවර බටහිර හා නැගෙනහිර උඩගම හා හගරන්කන්ද ග්‍රාම නිළධාරි වසම් වල ජිවත් වන පුද්ගලයින් තම ජීවිකාව ලෙස කිරි ගව පාලනය හා ආශ්‍රිත නිෂ්පාදන ආශ්‍රයෙන් ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නගා ගැනිමට උත්සහ දරයි. වර්ථමානය වන විට ශ්‍රී ලංකාව තුල දේශියව නිෂ්පාදනය කරන නැවුම් දියර කිරි සඳහා විශාල ඉල්ලුමක් ඇති වි තිබිම දේශිය කිරි නිෂ්පාදකයින්ගේ අනාගත අභිවෘද්ධියට වාසිදායක තත්වයකි.
නැවුම් දියර කිරි නිෂ්පාදනයට අමතරව කිරි ආශ්‍රිත වෙනත් නිෂ්පාදන (යෝගට් මුදවපු කිරි අයිස් ක්‍රිම් හා කිරි ටොෆි වැනි රස කැවිලි ) ආශ්‍රයෙන් තම ජිවනොපාය සවිමත් කර ගන්නා පිරිසක්ද වෙයි. නමුත් මෙම සියළු පිරිස් ගැටළු රැසකට මුහුණ දෙමින් මෙම නිෂ්පාදන කවයුතු වල නියලි සිටි. අප විසින් අදාල වසම් වල රාජකාරි සිදු කරන සංවර්ධන නිළධාරින් හරහා සිදු කල පූර්ව සමික්ෂණයේදි ඔවුන්ගේ පවතින ගැටළු හදුනා ගන්නා ලදි.

01.කිරි ගවයින් ගාල් කර තැබිමට ප්‍රමාණවත් ලෙස නිසි පරිදි ඉදි කල ගව මඩුවක් නොතිබිම.

දැනට බොහෝ පිරිසක් ගවයින් ගාල් කර ඇත්තේ අනාරක්ෂිත ලෙස ඉදි කරන ලද ගව මඩු තුලයි. ප්‍රමාණවත් ඉඩකඩක් නොතිබිම නිසි පරිදි සෙවිලි කර නොතිබිමෙන් කිරි ගවයින්ගේ පැවැත්මට අහිතකර ලෙස බලපායි. කිරි දොවා ගැනිමේදි වුවත් සෞඛ්‍ය ආරක්ෂිතව සිදු කර ගැනිමට ක්‍රමවත්ව සකස් කල ගව ගාලක් අවශ්‍යවේ.
ඒමෙන්ම ගවයින්ගේ මළමුත්‍රා පරිසරයට හානියක් නොවන පරිදි සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයකට අනුව බැහැර කිරිමට හැකිව අයුරින් ගාල ඉදි කිරිම වැදගත් වේ.

02.දියර කිරි සැපයුමට සාපේක්ෂව වෙළඳ පොල තුල ඉහළ ඉල්ලුමක් පැවතුනද ඒය පාරිභෝගිකයාට අලෙවි කර ගැනිමට නිෂ්චිත ස්ථානයක් නොමැතිකම.
කිරි ගව පාලනය සිදු කරනු ලබන්නේ මෙම ග්‍රාමිය ප්‍රදේශ තුලයි. නමුත් රත්තොට නගරය ආශ්‍රිතව විශාල ජනතාවක් ගැවසෙන බැවින් නගරයට සමිපව වෙළඳ සැලක් ඉදි කර කිරි හා ආශ්‍රිත නිෂ්පාදන අලෙවියට අවස්ථාව ලබා දිමෙන් අලෙවි අවස්ථා වැඩි කරගත හැකිය. දැනටමත් රත්තොට,කයිකාවෙල නගර ආශ්‍රිතව දියර කිරි අලෙවි කිරිමේ මධ්‍යස්ථානයක් නොමැත.
රජයේ පාසැල්, රෝහල්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යාල විශාල ප්‍රමාණයක් ඇති බැවින් නගරය ආශ්‍රිතව දෛනිකව බොහෝ පිරිසක් ගැවසේ. එමනිසා ඔවුන් සියළු දෙනා ඉලක්ක කරගනිමින් නගරය ආසන්නයේ කිරි හල ස්ථාපනය කිරීමට අපේක්ෂිතය.

03. ඌන තාක්ෂණය භාවිතය

කිරි නිෂ්පාදකයින් කිරි දොවා ගන්නේ අතින්ය.යම් අවස්ථාවක දෑත් වල විශබීජ රැදී තිබී ඒවා කිරි වලට මිශ්‍ර විය හැකිය.ඒබැවින් නවින යන්ත්‍රානුසාරයෙන් කිරි දොවා ගැනිමට මොවුන් යොමු කිරිම වැදගත්වේ

ගවයින්ගේ ගොම ආශ්‍රයෙන් කාබනික පොහොර නිෂ්පාදනයට යොමු කිරිම, ගව මුත්‍රා මගින් නිවසේ පරිභෝජනයට අවශ්‍ය ගෑස් නිපදවිම වැනි අතුරු නිෂ්පාසන සදහා අවශ්‍ය තාක්ෂණික දැනුම පුහුණුව ලබාදිම කාලෝචිතවේ.

04 මුල්‍ය දුෂ්කරතා පැවතිම.

මෙම කර්මාන්තයන් වල නියලෙන පිරිස් අඩු ආදායම්ලාභි පිරිසකි.

05 අවශ්‍ය උපකරණ හිග විම

ගවයින්ට අවශ්‍ය තණකොළ බොහෝ දෙනෙක් තවමත් කපන්නේ දෑකැත්තක් භාවිතයෙනි. මෙය අනාරක්ෂිත හා විශාල කාලයක් ශ්‍රමයක් වැය කිරිමට සිදු වන කටයුත්තකි.දොවා ගන්නා කිරි නිසි ලෙස ගබඩා කිරිමට අවශ්‍ය භාජන හිග විමත් කල් තබා ගැනිමට ශිතකරණ පහසුකම් නොමැති විමද ගැටළුවකි.

ඉහත හදුනාගත් ගැටළු සදහා විසදුමක් ලබාදි ඔවුන් සවිබල ගැන්විමේ අරමුණ ඇතිව සමෘද්ධි හා ක්ෂුද්‍ර මුල්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට යෝජිතයි.

## 03 පිහිටිම

දිස්ත්‍රික්කය: මාතලේ

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය : රත්තොට

ග්‍රාම නිළධාරි වසම : තඹලගල, පුංචි සෙළවාකන්ද, කන්දෙනුවර බටහිර, කන්දෙනුවර නැගෙනහිර, උඩගම හා හගරන්කන්ද ( ග්‍රාම නිළධාරි වසම් 06)

## 04 ව්‍යාපෘතියේ පසුබිම

මෙම වසම් වල උචිත දේශගුණික තත්වයක් තිබිමත් ඉඩකඩ සහිත භූමි ප්‍රදේශයක් පැවතිමත් තුලින් කිරි ගව පාලනයට යොග්‍ය පරිසරයක් නිර්මාණය වි ඇත. දැනට පවුල් 75ක් පමණ මෙම කිරි නිෂ්පාදන කටයුතු සිදු කරයි. මෙම දියර කිරි හා ආශ්‍රිත නිෂ්පාදන සදහා ප්‍රදේශයේ හොද පාරිභෝගික ඉල්ලුමක් පැවතිමද විශේෂත්වයකි.. එමෙන්ම ලොකයේ දියුණු රටවල් පරිභෝජනය කරනු ලබන්නේ දියර කිරි වන අතර ඒය කුඩා දරුවන්ට වැඩිහිටියන්ට පෝෂ්‍යාදායි ආහාරයක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය පවා පිළිගෙන ඇත. වර්තමානයේ භාවිතා කරන පිටි කිරි වල ශරිරයට අහිතකර සංඝටක විශාල ප්‍රමාණයක් අඩංගු බැවින් ප්‍රදේශයේ ජිවත් වන පුද්ගලයින් පෝෂ්‍යාදායි නැවුම් දියර කිරි පරිභෝජනයට තව තවත් නැඹුරු කිරිමත්, ඒ තුලින් ප්‍රදේශයේ කිරි ගව පාලනය වැඩි දියුණු කිරිමටත්, අවස්ථාව හිමි වේ.

## 05 අරමුණු

1. කිරි ගොවීන්ගේ අවශ්‍යතා සැපිරීම තුලින් දියර කිරි හා ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරිම හා ශක්තිමත් ආර්ථිකයක් ඇති කිරිම.
2. දේශිය කිරි ගොවියා ශක්තිමත් කිරිම
3. ප්‍රදේශයේ ජනතාව පෝෂ්‍යදායි ආහාර රටාවකට හුරු කිරිම
4. කුඩා දරුවන්ගේ, ගර්භනී කාන්තාවන්ගේ පෝෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරිම

## 06 ව්‍යාපෘතිය සාධාරණීකරනය

දියර කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරිම තුලින් දෛනික ආදායම ලෙස අවම වශයෙන් රු 1 400.00 ක පමණ ආදායමක් ඉපයිමට හැකිවේ. එනම් මාසිකව රු. 42 000.00 පමණ අවම ආදායමක් මින් උපයා ගැනිමට හැකි බව පෙනි යයි. මොවුන්ගේ ප්‍රධාන ආදායම් විභවය වන්නේද මෙයයි. මෙයින් උපයන ලාභය වැඩි කර ගැනිමට නම් කිරි නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවිමත්, වෙළඳ පොල අවස්ථා වැඩි කිරිමට කටයුතු කිරිමත් හා අටශ්‍ය පහසුකම් ලබා දිමටත් කටයුතු කල යුතුය. අදාළ වසම් වල සංවර්ධන නිළධාරින් සිදු කල නිරික්ෂන චාරිකාවේදි ඔවුනට දැකගත හැකි වුයේ ඉතා සිමිත ඉඩකඩක් සහිත අක්‍රමවත් ලෙස ඉදි කර ඇති ගව මඩු ඇති බවයි. ඒමෙන්ම කිරි විවිධ සමාගම් සඳහා අලෙවි කලද ඒය සිදු වන්නේ අතරමැදිකරුවන් හරහා විමෙන් නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් නොලැබිම ද ගැටළුවකි. මෙයට විසඳුමක් ලෙස ගව මඩුවක් හා නිෂ්පාදනය කරන දියර කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරිමට වෙළඳ සැලක් ඉදි කර දිම සුදුසුය.

එමෙන්ම ඇතැම් අවස්ථාවල පුහුණු ශ්‍රමය තිබුනද නිෂ්පාදන සඳහා යොදා ගන්නා උපකරණ නොමැති විම හා මුල්‍ය අපහසුතා හේතුකොට ගෙන ව්‍යවසායකයෙකු ලෙස ඉදිරියට ඒමට බාධා ඇතිවි ඇත. අප රටේ වර්ථමාන ආර්ථික තත්වයට ගැලපෙන්නනේ නව ව්‍යවසායකයින් ලෙස රැකියා අවස්ථා ජනිත කරන පිරිසකි. ඒ සඳහා මෙය සාර්ථක විසඳුමක් ලෙස හඳුන්වා දිමට හැකිය

## 07. ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් තෝරා ගත් ආකාරය

| අනු අංකය | වසම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පුංචි සෙළවාකන්ද | 16 |

| | | |
|---|---|---|
| 02 | කන්දෙනුවර බටහිර | 10 |
| 03 | කන්දෙනුවර නැගෙනහිර | 11 |
| 04 | උඩගම | 8 |
| 05 | තඹලගල | 15 |
| 06 | හගරන්කන්ද | 15 |
| | **එකතුව** | 75 |

## 08. සෘජු ප්‍රතිලාභින් සංඛ්‍යාව

- තඹලගල, පුංචි සෙළුවාකන්ද, කන්දෙනුවර බටහිර, කන්දෙනුවර නැගෙනහිර, උඩගම හා හගරන්කන්ද යන වසම් වල කර්මාන්තයේ නියලෙන පිරිස - පුද්ගලයින් 75
  මේ තුළින් සෘජු ප්‍රතිලාභින්ට අමතරව වක්‍ර ප්‍රතිලාභින්ද විශාල ප්‍රමානයක් හදුනා ගත හැකිය (500 පමණ පිරිසක්)

## 09. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ක්‍රමවේදය

- කිරි හා ආශ්‍රිත නිෂ්පාදකයින් හදුනා ගැනිම-
  සිදු කල නිරික්ෂණ චාරිකාව තුලින් දැනට කිරි නිෂ්පාදන සිදු කරන හා අවශ්‍යතා අනුව වර්ගිකරණය. (ප්‍රතිලාභින් දැනටමත් හදුනාගෙන අවසන්)
- කිරි ගොවින් ඒකතු කර කිරි නිෂ්පාදකයින්ගේ සමිතියක් පිහිටු විම. ඒ හරහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිතය.
- තාක්ෂනය හදුන්වා දිම හා අවශ්‍ය පුහුණුව ලබා දිම-
  පුහුණු අවශ්‍යතා හදුනාගෙන තනිව හෝ කණ්ඩායම් වශයෙන් ජාතික පශු වෛද්‍ය කාර්යාලය හරහා පුහුණු අවශ්‍යතා සපුරා ගැනිම.
- අවශ්‍ය උපකරණ ලබා දිම
- අංග සම්පූර්ණ කිරි හලක් ඉදි කිරිම
- ඉහත සදහන් සමිතියේ නම ව්‍යාපාර නාම ලියාපදිංචිය යටතේ ලියාපදිංචි කර සියළු නිෂ්පාදන ඒම නමින් සිදු කිරිමට කටයුතු සැලසිම.
- වෙළඳපොල පහසුකම් සකසා දිම - අතිරික්ත දියර කිරි මහා පරිමාන දේශිය කිරි නිෂ්පාදනය කරන සමාගම් වෙත සෘජුව ලබා දිමට කටයුතු සැලසිම.

## 10 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමෙන් ලැබෙන ප්‍රතිලාභ

- තෝරා ගත් වසම් 6 හි කිරි ගොවීන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම
- කොට්ඨාසයේ ජනතාවට සෞඛ්‍යය ආරක්ෂිත නැවුම් කිරි හා කිරි ආශ්‍රිතනිෂ්පාදන පරිභෝජනයට අවස්ථාව උදා වීම
- කොට්ඨාසයේ කුඩා දරුවන්ගේ සහ ගර්භනී මව්වරුන් ගේ පෝෂණ ගැටලු අවම වීම
- කිරි හල හරහා කිරි නිෂ්පාදනයට පහසුකම් සැලසීම

## 11 ව්‍යාපෘතිය අධික්ෂණය හා පසුවිපරම

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- රත්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය
- සමෘද්ධි හා ක්ෂුද්‍ර මුල්‍ය අමාත්‍යාංශය
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

## 12. කාල රාමුව

| අනු. අංකය | ක්‍රියාවලිය | 2021 වර්ෂය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
| 01 | දියර කිරි හා ආශ්‍රිත නිෂ්පාදකයන් හදුනා ගැනිම<br>➢ ක්ෂේත්‍ර පරික්ෂණය සිදු කිර ගැටළු හදුනා ගැනිම<br>➢ කිරි නිෂ්පාදකයින්ගේ සමිතියක් පිහිටු විම | | | ■ | | | | | | | |
| 02 | තාක්ෂණය හදුන්වා දිම හා අවශ්‍යා පුහුණුව ලබා දිම | | | | ■ | ■ | ■ | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 03 | අවශ්‍ය උපකරණ ලබා දිම | | | | ■ | ■ | ■ | | | | |
| 04 | දියර කිරි හා ආශ්‍රිත නිෂ්පාදන අලෙවි සැලක් ඉදි කිරිම | | | | ■ | ■ | | | | | |
| 05 | වෙළදපොල පහසුකම් සකසා දිම | | | | | | ■ | ■ | ■ | ■ | ■ |

## 13. <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සදහා දළ වියදම් ඇස්තමේන්තුව</u>

*** <u>එක් ප්‍රතිලාභියකු සදහා දළ වියදම් ඇස්තමේන්තුව</u>**

| අනු අංකය | ක්ෂේත්‍රය | දළ ඇස්තමේන්තුව |
|---|---|---|
| 01. | ➢ **ප්‍රතිලාභියා විසින් දරන දායකත්වයේ වටිනාකම**<br>ගව මඩු, කිරි ගවයින්, උපකරණ,ශ්‍රම දායකත්වය | රු. 100 000.00 |
| 02. | ➢ **රජය විසින් ලබා දෙන ප්‍රදාන වල වටිනාකම**<br>ගව මඩුවල අඩු පාඩු සකස් කර දිම - රු.50000<br>උපකරණ ලබාදිම (වතුර ටැංකි, හෝස් බට, බූට් සපත්තු, උදළු, කිරි එකතු කරන භාජන) -රු.50000 | රු.100 000.00 |
| 03 | එකතුව | රු.200 000.00 |
| | | |

- <u>ප්‍රතිලාභීන් 75 දෙනෙකු සඳහා දළ වියදම් ඇස්තමේන්තුව</u>

| අනු අංකය | ක්ෂේත්‍රය | දළ ඇස්තමේන්තුව |
|---|---|---|
| 01. | **ප්‍රතිලාභීන් සඳහා රජය විසින් දරන වියදම**<br>ගව මඩුවල අඩු පාඩු සකස් කර දිම, උපකරණ ලබාදිස(වතුර ටැංකි,හෝස් බට, බූට් සපත්තු,උදළු) -75*100000 | රු. 7 500 000.00 |
| 03 | **ප්‍රතිලාභියා විසින් ව්‍යාපෘතිය සඳහා දරන දායකත්වය (රු. 100 000.00* 75 )**<br>(ගව මඩු, කිරි ගවයින්, උපකරණ,ශ්‍රම දායකත්වය) | රු. 7 500 000.00 |
| 03 | **කිරි හල ඉදි කිරිම**<br>කිරි හල ඉදි කිරිම =රු 20 00 000.00<br>අවශ්‍ය කරන උපකරණ =රු250 000.00 | රු.2 250 000.00 |
| | **ව්‍යාපෘතියේ මුළු පිරිවැය**<br><br>**ප්‍රතිලාභීන්ගේ දායකත්වය** | **රු.17 250,000.00**<br><br>**රු. 7 500 000.00** |
| 03 | **ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත ප්‍රතිපාදන මුදල** | **රු.9,750,000.00** |
| | **පරිපාලන වියදම් 2.5%** | **රු. 250 000.00** |
| | **ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත මුළු ප්‍රතිපාදන මුදල** | **රු.10,000,000.00** |

## 14. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන පාර්ශවකරුවන්

| ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | තනතුර | දුරකථන අංකය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රත්තොට | සි.එල්.තිලකරත්න මිය (සහකාර අධ්‍යක්ෂ)<br>බි. එම්. සි. ජේ. කේ. බස්නායක මිය (විෂය භාර නිලධාරි) | 071-8064757<br><br>071-3877630 |
| සමෘද්ධි හා ක්ෂුද්‍ර මූල්‍ය අමාත්‍යාංශය | චාන්දනි රණසිංහ මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ) | 011 2186042<br>071-5344071 |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | ඉදිරියේදි සම්බන්ධකර ගැනිමට නියමිතයි | |

**15. ඉදිරිපත් කලේ :** රත්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලීය

සැලසුම් අංශය **දිනය :**

**16. නිර්දේශය :** **දිනය :**